# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.08.16 පැය 1225 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1600/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**බෙල්ලන්විල රජමහා විහාරස්ථානයේ ඇසළ මහා පෙරහර වීථි සංචාරය කිරීම හේතුවෙන් රථ වාහන ගමනාගමනය සීමා කිරීම**

2025.08.15 වන දින D/Media/Out/ 1594 /2025 යටතේ පැය 2045 ට යොමු කරන ලද මාධ්‍ය නිවේදනය හා බැඳේ.

බෙල්ලන්විල රජමහා විහාරස්ථානයේ වාර්ෂිකව පවත්වනු ලබන ඇසළ පෙරහරහි රන්සීවලී පෙරහර 2025.08.15 වන අද දින රාත්‍රී 07.00 සිට අළුයම දක්වාත් 2025.08.16 වන දින රන්දෝලි මහා පෙරහර රාත්‍රී 07.00 සිට අළුයම දක්වා බොරලැස්ගමුව පොලිස් වසමේ බෙල්ලන්විල රජමහා විහාරස්ථානය අවට ප්‍රධාන මාර්ග මූලික කරගෙන වීථි සංචාරය කිරීමට නියමිතය.

මෙම පෙරහර බෙල්ලන්විල රජමහා විහාරස්ථානයේ දකුණු වාහල්කඩින් පිටත්ව බෙල්ලන්තර හන්දියෙන් කීල්ස් වටරවුම දක්වා ගමන් කර මාර්ග අංක 117 විහාර මාවත හන්දියෙන් විහාර මාවතට ගමන් කර මාර්ග අංක 119 විහාර මාවත දක්වා විහාරයේ දකුණු වාහල්කඩින් විහාරස්ථානය දක්වා ගමන් කිරීමට නියමියත.

**පෙරහර ගමන් ගන්නා කාලය තුළ පහත ස්ථාන වලින් රථ වාහන ගමනාගමනය සීමා කරනු ලබයි.**

- කොහුවල බොරලැස්ගමුව 120 මාර්ගයේ බොරලැස්ගමුව හන්දියෙන් හා පැපිලියාන හන්දියෙන් පෙරහර ගමන් කරනු ලබන මාර්ගය දෙසට රථ වාහන සීමා කරනු ලබයි.
- දෙහිවල දෙස සිට නැදිමාල හන්දිය හරහා බොරලැස්ගමුව හන්දිය දෙසට ගමන් කරනු ලබන රථ වාහන නැදිමාල හන්දියෙන් හා ඇල්ඩර්සන් පාර හන්දියෙන් සීමා කර ඇන්ඩර්සන් පාර ඔස්සේ කොහුවල දෙසට යොමු කරනු ලබයි.
- ගල්කිස්ස දෙස සිට නුගේගොඩ දක්වා 117 මාර්ගය දෙසට ගමන් කරනු ලබන වාහන බේකරිය හන්දියෙන් ගාලු පාරට යොමු කරනු ලබයි.

**පහත ස්ථාන වලින් පෙරහර ගමන් ගන්නා කාලය තුළ සම්පූර්ණයෙන් රථ වාහන ගමනාගමනය සීමා කරනු ලබයි.**

- 119 මාර්ගයේ මාලනී බුලත්සිංහල හන්දිය
- 119 මාර්ගයේ බෙල්ලන්තර හන්දිය
- 117 මාර්ගයේ කීල්ස් වටරවුම
- 117 මාර්ගයේ විහාර මාවත හන්දියෙන් සියළුම රථ වාහන සීමා කරනු ලබයි.

ඉහත මාර්ගයන්හි සිදුවන අපහසුතාවය මගහරවා ගනිමින් තමන්ට අවශ්‍ය ගමන් මාර්ගයන්ට පිවිසීමට පොලිස් රථවාහන නිලධාරින්ගේ මග පෙන්වීම මත කටයුතු කරන මෙන් පොලිසිය රියදුරන්ගෙන් ඉල්ලා සිටී.

ඉහත නිවේදනය මහජනතාවගේ සහ රියදුරන්ගේ දැන ගැනීම සඳහා ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**